# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2471/13 – 2026 ජනවාරි මස 13 වැනි අඟහරුවාදා – 2026.01.13**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/COM/05/V/2015/165.
IR/COM/02/T/2015/42.
IR/COM/02/C/2014/82.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 1. 2017.06.16 දිනැති හා අංක 2023/57, 2. 2017.06.29 දිනැති හා අංක 2025/30 හා 3. 2017.06.14 දිනැති හා අංක 2023/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට්පත්‍රවල ප්‍රසිද්ධ කරන ලද 2017.06.06, 2017.06.22, 2017.06.09 යන දිනයන්හි දරන නියෝගවලින් පිළිවෙලින් එක් පාර්ශ්වයක් වශයෙන් 1. ගොකරුල්ල, ඉපලව, අංක 754හි පදිංචි ජී.ඩබ්.නිමල් කුමාර මයා ඇතුළු සේවකයින් 18 දෙනා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී.බී. ජයා මාවත, අංක 500හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එක් පාර්ශ්වයක් වශයෙන් 2. අරලගංවිල, පිඹුරත්තෑව, අංක ඩී 12, මහවැලි කඳවුර හි ආර්.එම්. සෝමසිරි මයා ඇතුළු සේවකයින් 18 දෙනා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී.බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එක් පාර්ශ්වයක් වශයෙන් 3. ගම්පොල, නාරංවිට, පිහිල්ලදෙණිය, නො. 07 හි පදිංචි පී. ඉලංකෝන් මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී.බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් හා වෙත එවා ඇති අංක A 22/2017, A 2/2017, A17/2017 හා 2025.11.12 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 දෙසැම්බර් මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව

ජී.ඩබ්. නිමල් කුමාර මයා (ඇතුළු සේවකයන් 18 දෙනා),
අංක 754, ඉපලව, ගොකරුල්ල, කුරුණෑගල.

නඩු අංකය : A/22/2017
යොමු අංකය : IR/COM/05/V/2015/165

පළමු පාර්ශ්වය

එදිරිව

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
නො. 500, ටී.බී. ජයා මාවත,
කොළඹ 10.

දෙවැනි පාර්ශ්වය

ආර්.එම්. සෝමසිරි මයා (ඇතුළු සේවකයින් 18 දෙනා),
මහවැලි කඳවුර, ඩී 12, පිඹුරත්තෑව, අරලගංවිල.

නඩු අංකය : A/24/2017
යොමු අංකය : IR/COM/02/T/2015/42

පළමු පාර්ශ්වය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
නො. 500, ටී.බී. ජයා මාවත,
කොළඹ 10.

දෙවැනි පාර්ශ්වය

පී. ඉලංකෝන් මයා,
අංක 07, පිහිල්ලදෙණිය, නාරංවිට,
ගම්පොල.

නඩු අංකය : A/17/2017
යොමු අංකය : IR/COM/02/C/2014/82

පළමු පාර්ශ්වය

එදිරිව

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
නො. 500, ටී.බී. ජයා මාවත,
කොළඹ 10.

දෙවැනි පාර්ශ්වය

කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ ඔහුට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කරන ලදී.

කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වූයේ,

භාණ්ඩාගාර ලේකම්ගේ අංක PED/ප්‍රති 1/චක්‍රලේඛ/2011 හා 2011.04.29 දිනැති ලිපිය මඟින් වයස අවු. 57 න් ඔබ්බට අවුරුදු 60 දක්වා සේවය කිරීමට සේවකයා ඉල්ලීමක් කරන අවස්ථාවල සේවා අවශ්‍යතාවය හා සේවකයින්ගේ කාර්ය සාධනය යන කරුණු සැලකිල්ලට ගෙන වසරින් වසර සේවා දිගුව ලබාදීමට හැකි බව ලිඛිතව දන්වා තිබියදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවය කළ පහත නම් සඳහන්

සේවකයින්ට වයස අවු. 57 සිට 60 දක්වා වූ සේවා දිගුව ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වී ඇත්ද යන්න හා එලෙස අසාධාරණයක් සිදු වී ඇත්නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

ඒ අනුව A/22/2017 නඩුවෙන් පහත සේවකයින්ද,

1. ජී.ඩබ්. නිමල් කුමාර
2. ඩබ්.එම්. ඩිංගිරි බණ්ඩා
3. එච්.එම්.ඒ.බී. හේරත්
4. කේ.ඒ. ජස්ටින්
5. ඒ.එම්. රම්බණ්ඩා
6. ඒ.එම්. රත්නායක
7. ඩබ්.ඒ.සෝමදාස
8. කේ.බී. ප්‍රේමරත්න
9. පී.ජී. ආරියදාස
10. ටී.එම්. කිරිබණ්ඩා
11. එස්.ජී. ජේම්ස්
12. එස්.එම්. රම්බණ්ඩා
13. එල්.කේ. සුගතදාස
14. එන්.බී. කරුණාවතී
15. කේ.එම්.ටී.පී. බණ්ඩාර
16. ඩබ්.එච්.එච්.ඒ. දයාරත්න
17. ජී.ඒ. සරත් කරුණාසේන
18. ඩී. ජයවීර

ඒ අනුව A/24/2017 නඩුවෙන් පහත සේවකයින්ද,

1. ආර්.එම්. සෝමසිරි
2. ඊ.එම්. පොඩිමැණිකා
3. එම්.ජී. සීලවතී
4. එච්.එම්. හේමචන්ද්‍ර
5. ඩබ්.ඒ. චන්ද්‍රානි
6. ඩබ්ලිව්.ජී.ධර්මදාස
7. එච්.එම්. විජේරත්න
8. ඩී.එස්. විල්බට්
9. ආර්.එම්. අනුලාවතී
10. ඩී.ඒ. ජයසුන්දර
11. එන්.එස්.සී. මෙන්ඩිස්
12. පී.එම්.කේ. මුදලිගේ
13. ඩී. සිරිපාල
14. ජේ.පී. සේනානායක
15. ඩබ්.එස්. සාගරිකා කුමාරි
16. එස්. ගුණදාස
17. එස්. චන්ද්‍රසිරි විජේසිංහ
18. ඒ.පී. මහින්දපාල

A/17/2017 නඩුවෙන් පී. ඉලංකෝන් මයා ද පෙනී සිටී.

**ප්‍රදානය**

ලිපිගොනු අංක A/22/2017, A/24/2017 සහ A/17/2017

ඉල්ලුම්කරුවන් තම ස්ථාවරය බේරුම්කරණ අධිකරණයට ගොනු කරමින් සැළකර ඇති පරිදි,

සියළු පාර්ශ්වයන් මේ වන විට වාචික සහ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර ඇත. පළමු වන පාර්ශ්වය වෙනුවෙන් දැනට ශේෂ වී ඇති ශීර්ෂ පාඨ සංශෝධනය කර ඇති අයවලුන් සියළු දෙනාම සාක්ෂි ලබාදෙන ලදී. වගඋත්තරකරු එක් සාක්ෂිකරුවෙකු පමණක් සාක්ෂියට කැඳවා ඇත. පළමුවන පාර්ශ්වය සිය විභාග අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද ලේඛන වලට අමතරව පැ-05-(1) (ඒ), පැ-06(1) ඒ 17 (1) ඒ - 05 (2), පැ-13(1) සහ පැ 12 (1) යනුවෙන් ලේඛන කිහිපයක් ද සලකුණු කර ඇත.

ඉල්ලීම් තුනම එක්ව විභාගයට ගත් බැවින් මේ සියලු පළමු පාර්ශ්වකරුවන් වෙනුවෙන් ලිඛිත දේශනය මෙසේ ඉදිරිපත් කර සිටී.

2023.11.14 වන දින දෙවන පාර්ශ්වකාර වගඋත්තරකරු විසින් පළමු වන පාර්ශ්වයට මෙම නඩුව පවරා පවත්වාගෙන යාමට නොහැකි බවට විරෝධතාවයක් නැවත ඉදිරිපත් කරන ලදී. මෙවැනිම විරෝධතාවයක් මෙම නඩුව ඇසීමට පෙර ද ඉදිරිපත් කර ඇත. මූලික විරෝධතාවයක් ඉදිරිපත් කළ යුත්තේ නඩුව ආරම්භ කල මුල් අවස්ථාවේ වුව ද ඊට පටහැනිව මෙම මූලික විරෝධතාවය ඉදිරිපත් කර ඇති බව පළමු වන පාර්ශ්වය මා වෙත සැළකර සිටී.

ඉල්ලීම් කරන ලද පිරිස වෙනුවෙන් මූලිකව කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස්වරියක් විසින් සැලකිය යුතු කාලයක් තිස්සේ මෙම කාරණය පිළිබඳ විමර්ශනයක් සිදුකළ අතර, අනතුරුව කම්කරු ඇමතිතුමා විසින් ඉහත සඳහන් කරුණ බේරුම් කිරීම සඳහා මා බේරුම්කරුවෙකු ලෙස නම් කොට ඇත.

අනතුරුව මෙම කරුණ බේරුම්කරණය කිරීම සඳහා 2017.07.20 වන දින විස්තර ප්‍රකාශයක් පළමුවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇත. ඉන් අනතුරුව මෙම ආරාවුල බේරුම්කරණය කිරීම සඳහා වගඋත්තරකරුවන් විසින් විරෝධතාවයක් ගොනු කල අතර, එකී විරෝධතාවය සම්බන්ධයෙන් 2018.10.16 වන දින නියෝගයක් ලබා දෙන ලදී.

අනතුරුව මෙම බේරුම්කරණ විභාග පැවැත්වීම ආරම්භ කරන ලද අතර, ඒ වන විට මෙම පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කරුවන් විශාල පිරිසක් බැවින් සියළු දෙනා වෙනුවෙන් පලාගල, බළලුවැව, ජයමාවත, අංක 25 දරන ලිපිනයෙහි පදිංචි ඩබ්.එම්.ඩිංගිරි බණ්ඩා යන අය පොදුවේ සියලු දෙනා වෙනුවෙන් දිවුරුම් ප්‍රකාශයක් මගින් සිය වාචිකයන් ඉදිරිපත් කරන ලදී. අදාළ දිවුරුම් ප්‍රකාශ සමඟ සියලු පාර්ශ්වකරුවන් වෙනුවෙන් පැ 01 සිට පැ 31 දක්වා ලේඛන ලකුණු කර ඇත.

එකී දිවුරුම් ප්‍රකාශය ලබා දීමෙන් පසු මෙම බේරුම්කරණය අධිකරණය විසින් වරින් වර විභාගය සඳහා පාර්ශ්වකරුවන් කැඳවන ලදුව ද පැවති කොරෝනා වසංගත සමය සහ වෙනත් ආර්ථික දුෂ්කරතා මත, වෙනත් ප්‍රායෝගික කාරණා මත මෙකී විභාගය පැවැත්වීම කල් යන ලදී. එසේ වුවද, බේරුම්කරණ සැසිවාරය මුලින්ම සාක්ෂි විභාගයට ගන්නා ලද්දේ 2020.01.17 වන දින දීය. ඊට පෙර දිනවලදී පළමුවන පාර්ශ්වය විසින් මෙම බේරුම්කරණය සාක්ෂි ඉදිරිපත් කිරීමේ ස්වභාවය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී. සියළු දෙනා වෙනුවෙන් එක ඉල්ලුම්කරුවෙකු වන ඉහත කී ඩබ්.එම්. ඩිංගිරි බණ්ඩා මහතා සියලු දෙනා වෙනුවෙන් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය සම්බන්ධයෙන් වගඋත්තරකරුවන්ගේ හරස් ප්‍රශ්න වලට ලක් වන ලදී.

එමෙන්ම විවිධ අවස්ථාවල මෙම ඉල්ලීම සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් සිය විරෝධතාවයක් ඉදිරිපත් කරන ලදී. එකී විරෝධතා සම්බන්ධයෙන් මෙම ලිඛිත දේශනය තුලින් සිය වාචික ඉදිරිපත් කරන බවද සැළකරන ලදී.

මෙම පළමු පාර්ශ්වකාර සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමෙන් අනතුරුව වගඋත්තරකාර පාර්ශ්වය විසින් පළමුවන පාර්ශ්වකරුවන් විශාල පිරිසක් බැවින් ඔවුන් වෙනුවෙන් එක් අයෙකු පමණක් සාක්ෂි දීම ප්‍රමාණවත් නොවන බව සැළකර සිටි හෙයින් ඒ වන විට ශීර්ෂ ගත පළමුවන පාර්ශ්වකරුවන් සියළු දෙනා සාක්ෂි දෙන ලද අතර ඔවුන්ගෙන් හරස් ප්‍රශ්නද ඇසීමට අවස්ථාව සලසා දෙන ලදී.

පළමුවන පාර්ශ්වකරුවන් විසින් මෙම බේරුම්කරණ අධිකරණය සඳහා ඉදිරිපත් කර ඇති පොදු දිවුරුම් ප්‍රකාශය හෙවත් ඩබ්.එම්. ඩිංගිරි බණ්ඩා මහතා විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ සලකුණු කරන ලද ලේඛන සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් විරෝධතාවයන් ඉදිරිපත් කිරීමක් ඉදිරිපත් කර නැති බවත්, එම ලේඛන මෙම බේරුම්කරණ අධිකරණය ඉදිරියේ පිළිගත්, වලංගු ලේඛන බවත්, සලකා බැලීමට යටත් වන බවද මුල් අවස්ථාවේදීම පෙන්වා දෙන ලදී.

බේරුම්කරණයට තුඩු දුන් කාරණය ඉතා කෙටියෙන් පැහැදිලි කරන්නේ නම්, මෙම සියලු දෙනාම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉතා දීර්ඝ කාලයක් සේවය කරන ලද අතර, විශේෂයෙන් දුෂ්කර පළාත්වල සේවය කරන ලද අයවලුන් පිරිසක් වේ. එමෙන්ම මෙම පිරිස අතරින් කිහිප දෙනෙක් සම්බන්ධයෙන් අසාදු සේවා වාර්තා වලට ලක්වී ඇත්තේ වුවද ඒ පිළිබඳව වගඋත්තරකරුවන්ට විනය පියවර ලබා දී ඇත. මෙම පළමුවන පාර්ශ්වකරුවන් සියලුදෙනාම 1977 සහ 1978 කාලවල උතුරු මැද වියළි කලාපයේ රජය විසින් දියත් කළ දැවැන්ත සංවර්ධන යෝජනා ක්‍රමයක් වූ මහවැලි සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා වගඋත්තරකරුවන් විසින් සේවයට යොදා ගත් පිරිසක් බවත්, එමෙන්ම මෙම සංවර්ධන ව්‍යාපාරයේ ආරම්භක සහ පූර්ව නිලධාරින් පිරිසක් බවත් මෙම ඉල්ලීමට අදාළ සියලු සේවක නිලධාරින් ඉතා දුෂ්කර ගමනාගමන පහසුකම් නොමැති එවකට ජනාවාස නොවූ ශුෂ්ක සහ දූවිලි වලින් ගහන මැලේරියා ආදී රෝග කාරක ප්‍රදේශවල සහ පසුව හටගත් ත්‍රස්තවාදී උවදුරු මධ්‍යයේ මැලේරියා රෝගවලටද ගොදුරු වෙමින් නිතර පානීය ජල ගැටළු වලට සහ අත්‍යාවශ්‍ය ආහාර ලබා ගැනීමේ දුෂ්කරතා වලද ප්‍රවාහන දුෂ්කරතා වල ද වන සතුන්ගේ ගහනයට ලක් වෙමින්ද විදුලි බලයද නොමැතිව මුල් කාලයේ පොල් අතු මඩුවල රැඳෙමින් වියළි කටුක සහ දූවිලි සහිත පරිසරයක කිසිදු මැසිවිල්ලක් තොරව කටුක තත්ත්වයක් විඳදරා ගනිමින් සේවයට කැප වී සේවය කළ බවත්, වර්තමානය වන විට මේ ඉල්ලුම්කාර සියලු පිරිස් මහවැලි සංවර්ධන ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා සැබෑ කොටස්කරුවන් වූ බව කියා සිටී. එම කාරණය පොදුවේ ලබාදුන් දිවුරුම් ප්‍රකාශයේ සඳහන් වේ. මේ සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් විසින් ඉහත සඳහන් පොදු කාරණා පිළිබඳව කියන ලද මෙම කාරණා සම්බන්ධයෙන් එය අසත්‍ය බව කිසිදු අවස්ථාවක ප්‍රකාශ කර නැත. ඒ මත ම මෙම ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම සලකා බැලිය යුතු අත්හල නොහැකි කරුණක් බව අධිකරණයට මුලින්ම පෙන්වා දුන් අතර, ඉහත කාරණය සම්බන්ධයෙන් මාගේ අවධානය යොමු කරන ලදී.

මෙම නඩුවේ මුල්ම සාක්ෂිකරු වූ ඩබ්.එම්. ඩිංගිරි බණ්ඩා මහතා සිය දිවුරුම් ප්‍රකාශයේ සඳහන් සම්ප්‍රකාශ වලින් ගරු අධිකරණයේ අවධානය යොමුකර සිටින අතර, එකී දිවුරුම් ප්‍රකාශය නැවත ප්‍රතිරාවය කරමින් එහි සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලෙස පළමු වන පාර්ශ්වකරුවන් අයැද ඇත.

මෙම ඉල්ලීමට තුඩු දුන් මූලික කාරණාව නැවත මතක් කරන්නේ නම් ඔවුන්ගේ සේවා දිගු ලබා නොදීම පිළිබඳව කරුණක් වේ. එය ලබා නොදීමේ හේතුව මත තවදුරටත් වැඩ කිරීමේ අවකාශය අහිමිවීම, තමන්ගේ පළපුරුද්ද සහ කුසලතාවයන් මහවැලි සංවර්ධන අධිකාරියට අහිමි වීම, අවු. 60 දක්වා සේවය කිරීමට ඉඩ ලැබුණේ නම් මෙම ඉල්ලුම්කරුවන්ට ලබා ගත හැකිව තිබූ පාරිතෝෂික මුදල්, සේවක අර්ථසාධක මුදල් සහ ඒ මත ලැබෙන ප්‍රතිලාභ අහිමි වීමත්, පවතින තත්ත්වයන් මත ඒ වන විට විශ්‍රාම ගන්වන වයස වන විට මෙම ඉල්ලුම්කරුවන්ගේ දරුවන් විවාහ වීමට අපේක්ෂාවෙන් සිටින මව්වරුන් සහ පියවරුන් බවද උසස් අධ්‍යාපනය නිම වූවන් සහ ඒ ආසන්නයේ සිටි දෙමාපියන් බවත්, ඔවුන්ගේ සියළු බලාපොරොත්තු අඩාල වූ බවත්, දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට තිබූ අවකාශය අහිමිවූ බවත්, මෙම දුෂ්කර රාජකාරි හේතුවෙන් ඇතැම් ඉල්ලුම්කරුවන්ට වාසස්ථානයක් හෝ නිසි ලෙස සකස්කර ගැනීමට අවකාශය නොවූ බවත්, දැඩි කම්පාවෙන් සහ කණගාටුවෙන් යුතුව සිය පොදු දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇත. තවද එම දිවුරුම් ප්‍රකාශයේම (2019.09.09 වන දින ගොනු කර ලද) ඩබ්.එම්. ඩිංගිරි බණ්ඩා මහතාගේ දිවුරුම් ප්‍රකාශයේ සියළු සම්ප්‍රකාශ නැවත ප්‍රතිරාවය කරන අතරම ඔහු එහි 18 වන සම්ප්‍රකාශයේ මෙසේ සඳහන් කරයි. එය මෙම ඉල්ලුම්කරුවන්ට පොදු කරුණක් බවද මම අවධාරණය කරමි.

**සජීවී කාර්මික ආරාවුලක් නොමැති වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ව්‍යවස්ථාව විසින් 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත මගින් සජීවී කාර්මික ආරාවුල් විසඳීම බේරුම්කරණ අධිකරණයක්ද සේවක - සේවා යෝජක සම්බන්ධතාව අවසන් වූ අවස්ථාවන්හිදී ඇති වන ගැටළු විසඳීමට 31බී වගන්තිය හරහා කම්කරු විනිශ්වයාධිකාරියක් ද පිහිටුවා ඇත. මෙසේ අධිකරණයන් දෙකක් පිහිටුවා ඇත්තේ එකිනෙකට සමාන නොවන අවස්ථාවන්හිදී හට ගන්නා කාර්මික ගැටලු විසඳීමට වන අතර එම අධිකරණ බලය නිසි පරිදි යොදා නොගැනීම මෙම පනත නිර්මාණය කිරීමේ මූලික අරමුණට පටහැනි වන බවත් එසේ කිරීම තුලින් මෙම පනත ක්‍රියාත්මක කිරීමේ අරමුණ නිරර්ථක වන බවත් අවධාරණය කළ යුතුව ඇත.

"කාර්මික ආරාවුලක් සම්බන්ධයෙන් බේරුම්කරුවෙකු විසින් දෙන ලද්දා වූ තත් කාලයෙහි වලංගුව ඇත්තා වූ ද, සෑම ප්‍රදානයක්ම මෙම පනතේ කාර්ය සඳහා 17 (2) වගන්තියේ විධිවිධාන වලට අනුකූලව ඒ ප්‍රදානය සඳහා පාර්ශ්ව, වෘත්තීය සමිති, සේවා යෝජකයන් සහ සේවකයන් විෂයයෙහි බැඳීමක් ඇති කරන ප්‍රදානයක් වන්නේය. තවද ඒ තීරණයෙහි ඇතුළත් නියමයෙන් ඒ ප්‍රදානයෙන් බැඳී සිටින සේවා යෝජකයන් සහ සේවකයන් අතර ඇති ගිවිසුමේ ව්‍යවස්ථාපිත නියමයක් වන්නේය" යනුවෙනි.

කාර්මික ආරාවුල් පනතේ 17 (2) වන වගන්තිය යටතේ දක්වා ඇති ආකාරයට

"බේරුම්කරුවෙකුගේ සෑම ප්‍රදානයක්ම ඒ තීරණය අදාළ වන්නා වූ පාර්ශ්ව (සේවා යෝජකයින්, සේවකයින් සහ වෘත්තීය සමිති) කවුරුත් දැයි සඳහන් කරනු ලැබිය යුතුය"

ඉහත වගන්තිය අනුව බේරුම්කරුවෙකු විසින් දෙනු ලබන ප්‍රදානයක් සේවායෝජකයා හා සේවකයා අතර පවතින සේවා ගිවිසුමෙහි කොන්දේසියක් බවට පත් වන්නේය. එබැවින් සේවකයා විශ්‍රාම ගොස් ඇති විටක දී එවැනි නඩු කටයුත්තක් සම්බන්ධයෙන් බේරුම්කරුවෙකු විසින් යම් ප්‍රදානයක් කළද තවදුරටත් පාර්ශ්වයන් අතර සේවා ගිවිසුමක් නොපවතින බව යන්නද මාගේ අවධානය යොමු කරන ලදී.

එසේම වගඋත්තරකාර පාර්ශ්වය සියළු දෙනාට එක හා සමානව සැලකීමේ මූල ධර්ම වලින් බැහැරව කටයුතු සිදුකර ඇති බව ඉල්ලුම්කරුවන්ගේ සාක්ෂි වලින් සනාථ වී ඇත. එසේ සිදු නොවූ බවට වගඋත්තරකරුවන් සාක්ෂි ඉදිරිපත් කර ඇත.

ඉල්ලුම්කරුවන් පැ 1 සිට පැ 31 දක්වා සලකුණු කරන ලද ලේඛන ඉදිරිපත් කර ඇති අතර, වගඋත්තරකාර පාර්ශ්වය ආර් 1 සිට ආර් 61 දක්වා ලේඛන ඉදිරිපත් කර ඇත. මේ සියලු ලේඛන කෙරෙහි මාගේ අවධානය යොමු කරන ලදී.

විමසීම ආරම්භ කළ දිනයේ සිට අවසානය දක්වා අවස්ථා කිහිපයකදීම වගඋත්තර පාර්ශ්වය මූලික විරෝධතා ඉදිරිපත් කරමින් ප්‍රකාශ කරන ලද්දේ, ඉල්ලුකරුවන්ගේ ඉල්ලීම කිසිදු නීතිමය පදනමකින් තොර බවත්, ඉල්ලුම්කරුවන්ට සිය සේවා කාලය දීර්ඝ කර ගැනීමට කිසිදු චක්‍රලේඛනයකින් කිසිම අවස්ථාවකදී ලබාදී නොමැති බවත්, පදනම් විරහිත ඉල්ලීමක් බවත් මුල් අවස්ථාවේදීම ප්‍රතික්ෂේප කළ යුතු බව දිගින් දිගටම බේරුම්කරණ අධිකරණයෙන් ඉල්ලා සිටි බවත්, අවසානය දක්වා ඔවුන්ගේ ස්ථාවරය ඒ ආකාරයෙන්ම පවත්වාගෙන එන ලදී.

ඉහත නඩු විභාගය මා වෙත විමසීම සඳහා කම්කරු ඇමතිතුමා විසින් ඔහුට ඇති බලතල යටතේ යොමු කරන ලද්දේ ඉල්ලුම්කරුවන්ට මොනයම් හෝ අසාධාරණයක් සිදුවී ඇතිද යන්න සොයා බැලීම සඳහාත් එසේම ඔවුන්ට හිමිවිය යුතු සහනය කුමක්ද යන්න මෙහිදී දෙපාර්ශවය කරුණු විමසීමෙන් අනතුරුව මා නිගමනයට එළඹෙන ලද්දේ මහවැලි අධිකාරිය විසින් කලින් කල ඉදිරිපත් කරන ලද චක්‍ර ලේඛන වලට අනුකූලව ඉල්ලුම්කරුවන්ගේ සේවය දීර්ඝ කිරීමේ සම්පූර්ණ බලය හා අයිතිය මහවැලි අධිකාරිය සතු බව පැහැදිලි වේ.

ඒ අනුව සේවා කාලය තවදුරටත් දීර්ඝ කිරීම පිළිබඳව අභිමතානුසාරී බලය මහවැලි අධිකාරිය සතු බව පැහැදිලි වේ. මෙම බලය අභියෝගයට ලක් කිරීමක් සිදු වී නොමැත.

එසේ හෙයින් ඉල්ලුම්කරුවන්ට සිය සේවා කාලය දීර්ඝ කර ගැනීමට නීතිමය අයිතියක් නොමැති බව මා නිගමනය කරමි.

එහෙත් සේවා කාලය දීර්ඝ කිරීමේ දී යම් යම් අවස්ථාවලදී පදනමකින් තොරව සිදුවී ඇති බව සාක්ෂි විමසීමේ දී තහවුරු විය.

මෙහිදී යම් යම් සේවකයින්ගේ සම්බන්ධතා හේතුකොට ගෙන සාධාරණ නොවන ආකාරයකින් සේවා කාලය දීර්ඝ කර ඇති බව ද පැහැදිලිව දක්නට ඇත.

ඉහත අක්‍රමිකතා හේතුවෙන් ඉල්ලුම්කරුවන් අවු. 60 දක්වා සේවය කිරීමට ඉල්ලුම්කරුවන් හට යම් බලාපොරොත්තුවක් ඇතිවීමට කරුණු හේතු සාධක වී ඇති බව පැහැදිලිව දක්නට ඇත.

තවද මහවැලි යෝජනා ක්‍රමය ආරම්භ වී ඒ වන විට රටේ ඇති වී තිබූ යුධ තත්ත්වයන් හේතු කොට ගෙන මායිම් ගම්මාන වල මෙම ඉල්ලුම්කරුවන් මූලික පහසුකම්වත් නොමැතිව වසර ගණනාවක් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කර ඇති බවද ඔවුන් සේවය කළ ප්‍රදේශ වලින් පැහැදිලි වේ. මේ තත්ත්වය බැහැර කළ නොහැක.

ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීමට නීතිමය අයිතියක් නොමැති වුව ද ස්වාභාවික යුක්ති නීති මූල ධර්ම පදනම් කරගනිමින් සලකා බැලිය යුතු බව මාගේ නිගමනයයි.

ඉල්ලුම්කරුවන් සඳහා සේවා දිගුව ලබා නොදීම පිළිබඳව වගඋත්තරකරුවන් සාධාරණ පදනමකින් තොරව තම අභිමතානුසාරී බලය උපයෝගී කරගෙන ඇති බව පැහැදිලි වේ.

ඉල්ලුම්කරුවන් හට සේවා දිගුව ලබා නොදීම හා වෙනත් සේවකයින් හට සේවා දිගුව ලබා දීම පිළිබඳව සාධාරණීයකරණ කිරීමට වගඋත්තර පාර්ශ්වය අපොහොසත් වී ඇත.

වන්දි තීරණය කිරීමේදී වගඋත්තරකාර ආයතනය (ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය) දැනට පවතින තත්ත්වය පිළිබඳව මාගේ අවධානය යොමු කරමි.

පරීක්ෂණ අවස්ථා සඳහා පෙනී නොසිටි බැවින් මේ අතරින් සේවකයින් 11 දෙනෙකු ඉවත් කර ඉතිරි සේවකයින් 26 දෙනා සඳහා පමණක් ප්‍රදානය ලබා දෙන ලදී.

ඒ අනුව පහත පරිදි ඉල්ලුම්කරුවෙකු සඳහා වන්දියක් වශයෙන් අවසාන මාසයේදී ලැබූ මූලික වැටුප මෙන් හය ගුණයක් ලබාදිය යුතු බව ද ඒ අනුව ඉල්ලුම්කරුවන් 26 දෙනාටම එය ක්‍රියාත්මක විය යුතු බවට ද නියම කරමි.

ඒ අනුව මුළු මුදල ලෙස රුපියල් හතලිස් අට ලක්ෂ තුන්සිය පහළොවක (4,800,315.00) මුදල මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළවී මාස 2ක් ඇතුළත සහකාර කම්කරු කොමසාරිස් මැද කොළඹ දිස්ත්‍රික් කාර්යාලය වෙත තැන්පත් කරන ලෙස නියම කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

| | නම | මූලික වැටුප | | එකතුව |
|---|---|---|---|---|
| 01 | W.M. ඩිංගිරි බණ්ඩා | 32175.00 | X 6 | 193,050.00 |
| 02 | K.A. ජස්ටින් | 38141.25 | X 6 | 228,847.50 |
| 03 | W.A. සෝමදාස | 31625.00 | X 6 | 189,750.00 |
| 04 | G.W. නිමල් කුමාර | 32720.00 | X 6 | 196,320.00 |
| 05 | H.M.A.B. හේරත් | 39896.25 | X 6 | 239,377.50 |
| 06 | A.M. රම්බණ්ඩා | 25380.00 | X 6 | 152,280.00 |
| 07 | K.M.T.P. බණ්ඩාර | 48558.75 | X 6 | 291,352.50 |
| 08 | P.G. ආරියදාස | 40451.25 | X 6 | 242,707.50 |
| 09 | D. ජයවීර | 45430.00 | X 6 | 272,580.00 |
| 10 | T.M. කිරිබණ්ඩා | 29560.00 | X 6 | 177,360.00 |
| 11 | N.B. කරුනාවතී | 27830.00 | X 6 | 166,980.00 |
| 12 | D.H.H.A. දයාරත්න | 24530.00 | X 6 | 147,180.00 |
| 13 | K.B. ප්‍රේමරත්න | 31595.00 | X 6 | 189,570.00 |
| 14 | S.M. රම්බණ්ඩා | 22010.00 | X 6 | 132,060.00 |
| 15 | L.K. සුගතදාස | 22950.00 | X 6 | 137,700.00 |
| 16 | D. සිරිපාල | 24260.00 | X 6 | 145,560.00 |
| 17 | W.A. චන්ද්‍රානි | 26890.00 | X 6 | 161,340.00 |
| 18 | S. චන්ද්‍රසිරි විජේසිංහ | 26110.00 | X 6 | 156,660.00 |
| 19 | P.M.K. මුදලිගේ | 28180.00 | X 6 | 169,080.00 |

| | නම | මූලික වැටුප | | එකතුව |
|---|---|---|---|---|
| 20 | J.P. සේනානායක | 32285.00 | X 6 | 193,710.00 |
| 21 | M.G. ශීලවතී | 30215.00 | X 6 | 181,290.00 |
| 22 | E.M. පොඩි මැණිකා | 27065.00 | X 6 | 162,390.00 |
| 23 | H.M. හේමචන්ද්‍ර | 23550.00 | X 6 | 141,300.00 |
| 24 | A.P. මහින්දපාල | 31250.00 | X 6 | 187,500.00 |
| 25 | D.A. ජයසුන්දර | 28870.00 | X 6 | 173,220.00 |
| 26 | P. ඉලංකෝන් | 28525.00 | X 6 | 171,150.00 |
| | | | | 4,800,315.00 |

**නීතිඥ කේ.ඒ. ට්‍රෙවෝ ප්‍රනාන්දු,**
බේරුම්කරු.

2025 නොවැම්බර් මස 12 වැනි දින,
බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව.

EOG 01-0116

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.